## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1994 අංක 25 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1994 දෙසැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1994 අංක 25 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 59/94.

### 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1994 අංක 25 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1991 අංක 52 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ දීර්ඝ නාමයේ "1993 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1994 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1995 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "1993 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1994 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1995 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ "5 වන සහ 6 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව" යන වචන හා ඉලක්කම් වෙනුවට "5 වන, 5අ සහ 6 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ—

(අ) "අදාළ කාර්තුවක යම් මාසයක දී" යන වචන වෙනුවට "1994 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක යම් මාසයක දී" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) (iii) වන අනුඡේදයේ "1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන හා ඉලක්කම් වෙනුවට "1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1995 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ, "1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තු වක" යන වචන හා ඉලක්කම් වෙනුවට "1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1995 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් අදාළ කාර්තු වක" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

**"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයනකරුවන්ගෙන් බද්ද කලින් එකතු කළ යුතු බව.**

5අ. (1) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩයක ආනයනකරුවකු වන්නා වූ මේ පනත අදාළ වන යම් තැනැත්තකුගෙන්, ඒ භාණ්ඩය ආනයනය කරන අවස්ථාවේ දී—

(අ) රේගු ආඥාපනතට අනුකූලව රේගු බදු කාර්ය සඳහා නිශ්චය කරන ලද (පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තු අගය සහාය ලෙස නිරූපණය කරන්නා වූ) ඒ භාණ්ඩයේ වටිනාකමින් ; සහ

(ආ) ඒ භාණ්ඩය මත ගෙවන ලද යම් රේගු බද්දක් වේ නම්, ඒ රේගු බද්දේ මුදලින් ; සහ

(ඇ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් ප්‍රමාණ එකතු කරන ලද විට ලැබෙන මුදලින් සියයට විසිපහකින්

සියයට තුනහමාරකට සමාන මුදලක් එකතු කර ගත යුතු අතර, එසේ එකතු කරන ලද මුදල සඳහන් කරමින් ඒ භාණ්ඩයට අදාළ ආනයන ඉන්වොයිස් පත්‍රයේ පිටපතක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එකතු කරනු ලැබිය හැකි යම් මුදලක්, ඒ මුදල එකතු කර ගැනීමේ සහ අයකර ගැනීමේ කාර්යය සඳහා ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, රේගු ආඥාපනත යටතේ ගෙවිය යුතු රේගු බද්දක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ මුදල එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, මේ පනත අදාළ වන යම් තැනැත්තකුගෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරන ලද යම් මුදලක්, ඒ මුදල රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරන ලද

දිනයෙහි ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබුවේ යයි සලකනු ලැබුවේ යම් අදාළ කාර්තුවක ද, ඒ අදාළ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්දට ප්‍රතිපක්ෂව හිලව් කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් පිටත දී නිෂ්පාදනය කරන ලදුව, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩයක්—

(අ) රේගු ආඥාපනත යටතේ අයවිය යුතු යම් බද්දක් වෙනුවෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියට, ඒ පනත යටතේ අයවිය යුතු මුදල් කිසිවක් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ; හෝ

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා

විසින් විකුණන ලද අවස්ථාවක, ඒ භාණ්ඩයේ ගැණුම්කරු, ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා වශයෙන් සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ අනුව ඔහුට අදාළ විය යුතු ය.

(5) යම් ආනයනකරුවකු විසින් යම් භාණ්ඩයක් ආනයනය කරනු ලබන අවස්ථාවේ දී—

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් ; හෝ

(ආ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව යම් බැංකුවක් විසින්

ඒ භාණ්ඩය වෙනුවෙන් ඒ ආනයනකරුගෙන් යම් මුදලක් එකතු කරනු ලැබ ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, එසේ එකතු කර ගන්නා ලද මුදල, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උප වගන්තිය යටතේ එකතු කළ හැකි මුදලට ප්‍රතිපක්ෂව හිලව් කරනු ලැබිය යුතු ය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

" උපලේඛනය [3 වන වගන්තිය]

| කාර්තුව | අනුප්‍රමාණය |
|---|---|
| 1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 1 |
| 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 2.3 |
| 1992 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1994 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා | සියයට 3 |
| 1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1996 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා | සියයට 3.5. " |

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.